# සමකාලීන දර්ශන සම්ප්‍රදායන්ට පසුබිම සැකසූ එම්මානුවෙල් කාන්ට්: දාර්ශනික විමර්ශනයක්.

ජේ.එම්.අර්. චාමලී ජයසිංහ

## හැඳින්වීමඃ-

යුගප්‍රවර්තකයා යැයි නම් ලබන්නේ එවකට ලොව සිටි උසස්තතම දාර්ශනිකයා කාන්ට් බව පැවසීමට බොහෝ දාර්ශනිකයන් මැලි නොවුණු නිසාම නොව, කාන්ටියානු අවධියේම බොහෝ චින්තකයින් හා දර්ශනවාදීන් සිටිය ද ඔවුහු කිසිවිටකත් කාන්ට්ගේ දාර්ශනිකත්වයට නොපැමිණි නිසා විය හැක.

කාන්ටියානු විඥානවාදය(Kantian Idealism) සමඟින් විකසිත වූ නූතන දර්ශනය(Modern Philosophy) තුළ පමණක් කාන්ට් නොනැවතෙන බවත් පසුව පැමිණෙන සමකාලීන දර්ශන සමුප්‍රදායන් වන,

- සමකාලීන විශ්ලේෂී දර්ශනය(Contemporary Analytical Philosophy)
- මහාද්වීපික දර්ශනය(Continental Philosophy)

යන සම්ප්‍රදායන් සමඟද අත්වැල් බැඳගත්තා වූ සුවිශේෂී දාර්ශනික පද්ධතියක් කාන්ට් සතුවූ බවත් සඳහන්කිරීම අතිශයෝක්තියක් නොවේ.

දහඅට වන ශතවර්ෂයේ සිට විසිඑක් වෙනි සියවස දක්වා කාලය තුළ ප්‍රකාශයට පත් වූ විශ්ලේෂී - මහාද්විපික දාර්ශනික ගැටලුව සාකච්ඡා කිරීමට කාන්ට්ගේ දර්ශනය අත්‍යාවශ්‍යය.

ක්‍රි.ව.1724 අප්‍රේල් 22, නැගෙනහිර ප්‍රසියාවේ කනිග්ස්බර්ග් හි උපන් මොහු ජර්මන් සභ්‍යත්වයේ මුදුන්මල ලෙස පිළිගත් ජර්මන් ආලෝකය නැමති යුගයේ ජීවත්විය. ප්‍රංශ විප්ලවයේ ප්‍රධානතම අනුගාමිකයෙකු වූ අතර, නැපෝලියානු හමුදාවන් විසින් පැවසූ නිදහස, සහෝදරත්වය හා සමානාත්මතාව ඉතා අගේකොට සලකා ඇත. විචාරාත්මක බුද්ධියක් ගවේෂණශීලී මනසක් තිබූ කාන්ට් 1755 දී පමණ ආචාර්ය උපාධිය ලබා, 1770 දී පමණ කනිග්ස්බර්ග් විශ්ව විද්‍යාලයේ දර්ශන විෂය පිළිබඳ මහාචාර්ය පදවිය ලබාගත් අතර 1804 පෙබරවාරි 12 වෙනි දින මෙලොවින් සමුගන්නා තෙක්ම දර්ශනයේ උන්නතිය උදෙසා කළ කැපවීම ඉමහත්ය.

## දාර්ශනික ප්‍රවේශය

කාන්ටියානු චින්තනයට විරුද්ධව කතාකරන්නෙකුට වුව ද මොහුගේ දාර්ශනික දායකත්වය අමතක කරමින් සමකාලීන බටහිර දර්ශනය තුළ පැනනැගෙන දර්ශන සම්ප්‍රදායන් පිළිබඳ සාකච්ඡා කළ නොහැක.

බටහිර දර්ශන ඉතිහාසයේ නූතන අවධිය නියෝජනය කරන්නාවූ ප්‍රධාන චින්තන ධාරා 03 නම්,

- බුද්ධිවාදය
- ආනුභූතිවාදය
- කාන්ටියානු විවේචක දර්ශනය යි.

මිනිසා දැනුම ලබාගන්නේ කෙසේ ද? යන දාර්ශනික ප්‍රශ්නය මුල්කරගනිමින් ඉදිරිපත්වූ බුද්ධිවාදීන් පිළිගත්තේ සහජ සංකල්පයන් මත පුද්ගල ඥානය ගොඩනැගෙන බවයි. ප්‍රාගානුභූතික ලෙස දැනුම අපගේ මනසේ නිලීනව පවතින බව පවසන ඩේක්ට්, ස්පිනෝසා, ලයිබ්නිට්ස් යන දාර්ශනිකයෝ මෙය නියෝජනය කළහ. තාර්කික චින්තනය, ගතිකමය සාධකයන්, ප්‍රාගානුභූති විශ්ලේෂණයන් සියල්ලම ආනුභූතියෙන් තොර බවත් මේවා මත ගොඩනැගෙන ඥානයේ බුද්ධිවාදී පදනම සත්‍යට හෝ යථාර්ථයට වඩා සප්‍රමාණවන බවත් පිළිගත්හ.

උදා:- සෑම වැහි දිනයක්ම තෙතමනය ඇති දිනයකි.

මේ තුළ ඇත්තේ නිගාමී විශ්ලේෂී රීතියකින් ගොඩනැගෙන්නා වූ චින්තන පද්ධතියකි.

මෙය ප්‍රතික්ෂේප කරමින් ගොඩනැගුණු ආනුභූතිවාදීන් පිළිගන්නේ උද්ගාමී තර්කයයි, පශ්චාත් ආනුභූතිකත්වයයි. දැනුමේ උල්පත ඉන්ද්‍රීය ප්‍රත්‍යක්ෂය වන අතර මෙහි ආරම්භකයා වන ජෝන් ලොක් පවසන්නේ මිනිස් මනස ස්වාභවයෙන්ම "පිරිසිදු හිස් පුවරුවක්"(Tabula Rasa) වැනි බවයි. මේ තුළ දැනුම ගොඩනැගීමට නම් පංචේන්ද්‍රියන් මගින් ලබාගන්නා අරමුණු මනසට ප්‍රක්ෂේපනය වියයුතු බවත් ලොක් පවසයි. ජෝර්ජ් බර්ක්ලේ, ඩේවිඩ් හියුම් මෙහි අනුගාමිකයන්ය. සංස්ථිතික ආනුභූවාදී දාර්ශනිකයෙන් වන හියුම් පසුකාලීන කාන්ටියානු දාර්ශනික මතවලට බෙහෙවින් බලපා ඇත. විද්‍යාත්මක ඥාන පදනමද ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය මුල්කර ගන්නා අතර එහි පරීක්ෂණ, නිරීක්ෂණ, සම්පරීක්ෂණ සියල්ල ඉන්ද්‍රියානුභූත උපන්‍යාස මුල්කරගෙන සිදුවන බව මොවුන්ගේ පිළිගැනීමයි.

## කාන්ටියානු විවේචක දර්ශනය (ඥානවිභාගය/Epistomology)

ඉහත දැක්වූ සාම්ප්‍රදායික ඥානවිභාගාත්මක සම්ප්‍රදායන් දෙකටම පක්ෂ නොවූ කාන්ට් ඒ දෙකේම ලක්ෂණ උපයෝගි කරගනිමින් ඥානය සම්බන්ධයෙන් නවතම දාර්ශනික අදහසකට ප්‍රවේශ විය.


නිව්ටෝනියානු විද්‍යාව, පර්සියානු සංස්කෘතිය හා සභ්‍යත්වය, රූසෝගේ අදහස් මෙන්ම ඩේවිඩ් හියුම් නැමති බ්‍රිතාන්‍ය ආනුභූවාදී දාර්ශනිකයා කාන්ට්ගේ දාර්ශනික අදහස් උදෙසා බෙහෙවින් ම බලපා තිබේ. කාන්ට්ගේ කෘතීන් වල **විද්‍යාවක් වශයෙන් ඉදිරිපත් කළහැකි ඕනෑම අනාගත පරභෞතික විද්‍යාවකට ප්‍රස්ථාවනාවක්** හි විමසුමේ තමාගේ ආදානග්‍රාහී නින්දෙන් තමාව අවධිකළේ ඩේවිඩ් හියුම් විසිනැයි කාන්ට් ම පවසා ඇත. හියුම්ගේ හේතුඵල විශ්ලේෂණය මොහුට තදින්ම බලපෑ අතර හියුම් විසින් ප්‍රශ්න කරනු ලැබූ හේතු-ඵල සංකල්පය, උද්ගමනය, කාල-අවකාශය, රෙනේ ඩේකාට්ස් නියතීන් ලෙස ගත් ආත්මය, විශ්වය, දෙවියන් වහන්සේ ආදි සියලු

සංකල්ප ද මධ්‍යකාලීන දේවධර්මය, නිව්ටෝනියානු විද්‍යාව ආදී සියල්ලම ද නිසාවෙන් එම්මානුවෙල් කාන්ට් ට දර්ශනයට පිවිසීමට සිදුවූයේ ගැටලුකාරී තත්වයකය.

එසේ පැමිණි කාන්ට් විසින් හියුම් බැහැරකළාවූ උක්ත සියලු සංකල්පනයන් පිළිගත හැකි නව දාර්ශනික පදනමත් ඇති කරන ලදී. එවන් සංකල්ප ආනුභූතිකව පවතින බවට තහවුරු කළ නොහැකිවූවත් ප්‍රාගානුභූතිකව පවතින බවට කාන්ට් තර්ක කරයි.

විධිමත් බවකින් යුත් ඥානවිභාගය (Epistomology) තුළ කාන්ට් ඥානය ලෙස අදහස් කළේ සර්වසාධාරණ විද්‍යාත්මක ඥානයයි. අප විෂය වස්තූන් දකින්නේ ඒවා පවතින ලෙසින් නොව, හුදෙක් අප පවතින ආකාරයෙන් බව පවසන කාන්ට්ට නිව්ටෝනියානු භෞතික විද්‍යාව හා ලයිබ්නිට්ස්, වොල්ෆ් වැන්නන්ගේ ඇතැම් ලක්ෂණ ද බලපා තිබේ. තවද බාහිර භෞතික ලොව පවත්නා කිසිම දෙයක් එලෙසින්ම දැකගත නොහැක යන මතය කාන්ට්ට ලැබී ඇත්තේ විද්‍යාත්මක චින්තනයෙනි. මෙසේ විවිධ අංශයන්ගෙන් පෝෂණය ලැබී තිබුණ ද කාන්ට්ගේ විශේෂත්වය වන්නේ සාම්ප්‍රදායික මතිමතාන්තර හා පිළිගැනීම් ප්‍රතික්ෂේප කර ඒවා විවේචනාත්මකව පෝෂණය කරමින් තමාටම සුවශේෂී වූ නව දර්ශනයක් ඉදිරිපත් කිරීමයි.

නිදඃ-




ඥානවිභාගයේ පදනම සැකසෙන්නේ කාලය හා අවකාශය නැමති ප්‍රාගානුභූතික සංවේදන ආකෘති හා ප්‍රමාණය, ගුණය, ප්‍රකාරය, සම්බන්ධය යන අවබෝධනීය පදාර්ථ තුළ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් බව කාන්ට් පවසන අතර ඥානය ගොඩනැගීමට අවශ්‍ය අමුද්‍රව්‍ය ලැබෙන්නේ ආනුභූතියෙන්ය. මෙය පසුව විධිමත් දැනුමක් බවට පත්කරන්නේ අවබෝධනය හෙවත් බුද්ධිය මගිනි. ඥානමය අමුද්‍රව්‍ය අභිසංස්කරණය කිරීම සඳහා අපතුළ ස්වාභාවයෙන් ම පවතින ප්‍රාගානුභූත දැනුමක් ඇත. එනම් කාලය හා අවකාශයයි.

පශ්චාත් ආනුභූතික දැනුම, ප්‍රාගානුභූත කාල හා අවකාශ රාමු තුළට ඇතුලත්කර එමගින් සංස්කරණය කරන ලද දැනුමක් ඕනෑම දෙයක් (Any objects/Any things) පිළිබඳව අපට ඇත. එසේ සංස්කරණය වන්නේ අවබෝධනීය පදාර්ථ දොළසක් ඔස්සේය.

නිදඃ- 01.ප්‍රමාණය - ඒකත්වය, විවිධත්වය, සමස්ථය

02.ගුණය - යථාභූතය, ප්‍රතිෂේධනය, සීමාව

03.සම්බන්ධය - නෛසර්ගිකත්වය, හේතුඵලත්වය, සමූහත්වය

04.ප්‍රකාරතාව - සත්භාවය, සත්ත්වය, ආවශ්‍යකත්වය

මෙම පදාර්ථයන් හා කාල අවකාශය යන ආකෘතීන් එකක් අනෙක මත යැපෙමින් අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් ක්‍රියාකරයි. ඒ අනුව අපට ලැබෙන්නා වූ ඉන්ද්‍රීය සංවේදනයන් අර්ථවත් කරන්නේ බුද්ධියෙනි. එසේම බුද්ධියට ඥානය පුබුදුවාලන්නට සංවේදන අවශ්‍යමය. සංජානනය විරහිත චින්තනය හිස්වන අතර අවබෝධන විරහිත සංකල්ප අන්ධය.

මෙවන් පර්යේෂණයන්හිලා කාන්ට් මෙහෙයවීම සඳහා විවිධ හේතුසාදක බලපෑවද ඒ සියල්ලෙන් වෙනස්ව මොහු තම ඥානවිභාගය නවාකාරයෙන් ගොඩනැගුවේය. මේ සම්බන්ධව ඔහු ලියූ වැදගත් ග්‍රන්ථ කිහිපයකි. එන්ම්,

01. ශුද්ධ විචාරයේ පරික්ෂාව (Critique of pure Reason-1781)
02. ප්‍රයෝගික විචාරයේ පරික්ෂාව (Critique of Practical Reason-1787)
03. විනිශ්චයේ පරීක්ෂාව (Critique of Judgement-1970)

වශයෙනි.

පළමු කෘතිය ඉතා වැදගත්වන අතර මෙහි නියාමක ප්‍රශ්නය වූයේ දැනුම කෙසේ බිහිවන්නේ ද? යන්නයි. පළමු විචාරය වශයෙන් මෙයට බෙහෙවින්ම ආකර්ෂණය වී ඇත්තේ විශ්ලේෂී දර්ශනයයි.

දෙවන විචාරය වන ප්‍රායෝගික විචාරයේ පරීක්ෂාව මීටවඩා වෙනස්ය. මෙහි සදාචාරයේ උදාරත්වය පිළිබිඹු වේ. සදාචාර ජීවිතය දර්ශනයේ මූලය බව මෙහිදි පහදා දෙන අතර මෙම කෘතිය ද සමීප වී ඇත්තේ විශ්ලේෂී දාර්ශනිකයන් සමඟය.

නමුත් මොහුගේ තෙවන කෘතිය වන විනිශ්චයේ පරීක්ෂාව ගනුදෙනු කරන්නේ සෞන්දර්යයාත්මක ක්ෂේත්‍රය සමග වන අතර එයින් විශ්ලේෂී දාර්ශනිකයන් බැහැරවී ඇත. මෙම අදහස සමඟ සමීප වී ඇත්තේ මහද්වීපික දාර්ශනිකයන්ය. මොවුන්ගේ දර්ශනයට මෙම කෘතිය වැදගත් වී ඇති අතර මෙය වනාහි පළමු හා දෙවන විචාරයන්ගේ (ශුද්ධ හා ප්‍රායෝගික හේතුව) සුසංයෝගයකි.

මේ අනුව එම්මැනුවෙල් කාන්ට් නැමති යුගප්‍රවර්තක දාර්ශනිකයා විශ්ලේෂී හා මහාද්වීපික යන සමකාලීන දර්ශන සම්ප්‍රදායන් හටද මහඟු දායකත්වයක් සැපයූ බව කිවහැකිය.

## කාන්ට් තුළ ඇති විශ්ලේෂී දාර්ශනික අන්තර්ගතයන්.

විවිධ අදහස් මාධ්‍යයේ අවසාන වශයෙන් විශ්ලේෂී හා මහාද්වීපික දාර්ශනික සම්ප්‍රදායන් දෙකටම පොදු අදහස් දැක්වූයේ ජර්මන් විඥානවාදයේ පෙරගමන්කරු වන එම්මානුවෙල් කාන්ට් ය. මෙම සම්ප්‍රදායන් දෙකෙහි පැවති ප්‍රධාන වෙනස්කම් පවා තීරණය වන්නේ යමෙකු විසින් කාන්ට්ව කියවන ආකාරය අනුවය. නූතන දර්ශනයේ ශ්‍රේෂ්ඨතමයා ලෙස සැලකෙන මොහුගේ අදහස් විශ්ලේෂී දර්ශනය උදෙසා කෙසේ දායක වන්නේ ද?

ප්‍රාගානුභූත ඥානයක් අපට ඇතැයි ප්‍රත්‍යක්ෂ කිරීමත් ඥානවිභාගයේ දාර්ශනික වැදගත්කමත් යන ප්‍රධාන කරුණු දෙකෙන් කාන්ට් ලබා ගත්තේ ගෞරවනීය ස්ථානයකි. කාන්ටියානු දර්ශනය අරඹන විට අසන්නාවූ ශුද්ධ ගණිතය ඇතිවිය හැක්කේ කෙසේද? යන්න සිත්අදනා, දුෂ්කර එකක්

බව විශ්ලේෂී දාර්ශනික **බ්‍රට්‍රන්ඩ් රසල්** පවසා ඇත. මෙවන් ප්‍රශ්න හා **කාන්ට්ගේ ආනුභූති-උත්තර දර්ශනය** විසිවන ශතවර්ෂයේ විශ්ලේෂී දර්ශනයට විශාල බලපෑමක් කර ඇත. එපමණක් නොව මොවුන් තර්ක කළේ කාන්ට් ඔවුන්ගේ ස්වභාවික විද්‍යාවන්, ගණිතය, තර්ක ශාස්ත්‍රය කෙරේ ද බලපෑ බවයි.

බුද්ධිවාදී සම්ප්‍රදාය වෙතින් ඉගෙනුම ලැබූ කාන්ට් **ඩේවිඩ් හියුම්ගේ සංශයවාදයෙන්** සසලව ඊට පිළිතුරු සෙවීමට යොමුවේ. කාන්ට් හේතු-ඵල සම්බන්ධය පමණක් නොව අංක ගණිතයේ හා ජ්‍යාමිතියේ සියලු ප්‍රස්තුත ද සංස්ලේෂී යැයි පැවසුවේය.

උදා:- 7+5=12

බුද්ධිවාදි අනුභූතිවාදී අදහස් දෙකෙන්ම පෝෂණය වූ කාන්ට් බුද්ධිවාදීන්ගේ ප්‍රකාශ ආනුභූතිවාදින්ගේ තර්ක මත සුසංයෝගි කිරීමට උත්සහ කරයි. නමුත් මෙහිදී රසල් පවසන්නේ කාන්ට් නිවැරදි නම් හෙට 225 වන අන්දමට අපගේ ස්වභාවය වෙනස් විය හැකි බවයි. ප්‍රපංචයේ ඇති කාල නියාමය තීරණය කරනු ලබන්නේ ප්‍රපංචය පිටුපස ඇති දේ තුළ පවතින ගතිලක්‍ෂණ මගින් යැයි ඔහුට තවදුරටත් සැලකීමට සිදුවෙතැයි ද රසල් පවසා ඇත. අපගේ තර්කයේ හරය සඳහා මෙය ප්‍රමාණවත් ය. මේ නිසා කාන්ට්ගේ විසඳුම ප්‍රාගානුභූතික ප්‍රස්තුතවල නිශ්චිතතාව විග්‍රහකිරීමට අසමත් මෙන්ම ඒවයේ විෂය පථය ද සීමා කරයි. මෙසේ විවේචන එල්ල කළ ද, ප්‍රාගානුභූතික ඥානය පිළිබඳ කතාකිරීමට තවදුරටත් මොවුන් යොමුවූයේ කාන්ට් නිසාය.

කාන්ට් විසින් දර්ශනය තුළ ඇති කළ **කොපර්නිකන් විප්ලවය** වැදගත්ය. මේත් සමඟ විචාරාත්මකව සම්බන්ධ වූවන් අතර රසල් පමණක් නොව විශ්ලේෂී දර්ශණයේ ප්‍රධානීන් වූ **ෆ්‍රෙජ්, මුවර්, විට්ගන්ස්ටයින්, තාර්කික යථානුභූතවාදින් මෙන්ම ඇමරිකානු උපයොගිතාවාදින් ද** ප්‍රධාන වේ. කාන්ට්ගේ ප්‍රථම විචාරය වන ශුද්ධ විචාරයේ පරික්‍ෂාවේ හා දෙවන විචාරය වන ප්‍රායෝගික විචාරයේ පරික්‍ෂාව යන කෘතීන් සමඟ එහි ඥානවිභාගාත්මක කරුණු පිළිබඳ මොවුන් බෙහෙවින් සැලකිලිමත්ව ඇත. මෙම සමකාලීක දර්ශනයේ වැදගත් කොට සලකන ඥානවිභාගය, අධිභෞතිවාදයේ නියම ස්වරූපය, දෙවියන්ගේ පැවැත්ම, ප්‍රස්තුත විභාගය ආදී සංකල්පයන් මෙහි භාවිතාවන අන්දමින් මුල්වරට පරීක්‍ෂාකර ඇත්තේ එම්මානුවෙල් කාන්ට් වන අතර එම පරීක්‍ෂාවලින් සමකාලීන දර්ශනයට ප්‍රාණවත් ආලෝකයක් ද ලැබී ඇත.

අපගේ ප්‍රජානනය වස්තූන් සමග අනුකූලවන බවත්, ප්‍රාගානුභූතික දේ සම්බන්ධව අපට දැනුමක් ලබාගත නොහැකි බවත්, එසේම අපට සංශ්ලේෂී විනිශ්චයන් ගොඩනැගිය හැකි බවත් යනාදි කාන්ට්ගේ ප්‍රවේශයන් සමග විසිවන වියවස පුරාවටම විශ්ලේෂී දාර්ශනිකයන් ගැටී ඇත. මෙහි දී කාන්ට් දක්වන ඉහත කරුණුත්, සංශ්ලේෂී විනිශ්චයන් ප්‍රාගානුභූතික ලෙස පවතින ආකාරයත්, ආනුභූතියේ වාස්තවික පදනම සංකල්පයන් වන ආකාරයත් වැනි කරුණු පිළිබඳ මොවුන් ගැටී ඇති අතර, කාන්ට්ගේ **විචාරාත්මක විඥානවාදය හා ප්‍රපංචමය හා නිෂ්ප්‍රපංචමය ලෝකයත්** පිළිබඳ අදහස් සමග ද විශ්ලේෂී දාර්ශනිකයන් ගනුදෙනු කරයි.

කාන්ට්ට අනුව ප්‍රාගානුභූතික විචාරාත්මක ප්‍රජානනයට ළඟාවිය හැක්කේ දෘශ්‍යමානයන්කරා මිස දේවල්වල යථාර්ථයට නොව. කාලය-අවකාශය තුළ පවතින ප්‍රපංචමය ලොව සංවේදන ඇසුරෙන් දැනගත හැකි අතර, අපගේ ආනුභූතියෙන් වියුක්ත ලොවක් ද ඇත. මෙම කරුණු පිළිබඳ

විමසන බ්‍රර්ට්‍රන්ඩ් රසල් වැනි අය විවේචනාත්මක දැක්මක් යොමුකර ඇත. ගණිතමය තර්ක ශාස්ත්‍රඥයන් වශයෙන් රසල් හා ෆේජ් යන දෙදෙනාම කාන්ට්ගේ මූලධර්මයන් වන **යම් යම් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සංශ්ලේෂී ප්‍රාග්- ආනුභූතික දැනුමක් ලබා ගත හැක** යන්නට විරුද්ධ නොවිණ. රසල්ගේ The problems of philosophy(1912) හා ෆ්‍රෙජ්(Frege) ගේ Foundations of Arithmetic යන කෘතීන් මෙහිදි වැදගත්ය. ෆ්‍රෙජ් එහිදි කියා සිටියේ කාන්ට් සංශ්ලේෂී හා විශ්ලේෂී විනිශ්චයන් එකිනෙක වෙන්කර ගැනීමට අගනා සේවයක් කරඇති බවයි.

කාන්ට්ගේ ජ්‍යාමිතික ප්‍රස්තුත සම්බන්ධ අදහස් වන, **සමස්ථ ශුද්ධ ගණිතමය ප්‍රාගානුභූතික වුවද, ඒවා විශ්ලේෂී නොව, සංශ්ලේෂීය** යන්න ෆ්‍රෙජ් අගය කර ඇත. නමුත් රසල් මීට වෙනස්ව කාන්ටියානු ඥානවිභාගය ප්‍රශ්න කරයි. මොහු පවසන්නේ කාන්ට්ගේ විසදුම ප්‍රාගානුභූතික ප්‍රස්තුතවල නිශ්චිතාව විස්තර කිරීමට අසමත් වනවා මෙන්ම ඒවායේ විෂයපථය ද සීමා කරන බවයි. මොහුගේ ප්‍රාගානුභූතික ඥානය බැහැර කරමින් රසල් පවසන්නේ ප්‍රාගානුභූත ඥානය වැරදි නොවේ නම් එය හුදෙක්ම අපගේ මනසේ සංයුතිය පිළිබඳ ඥානයක් නොව, ලෝකයේ මානසික හා මානසික නොවන හැමදේමට ම අදාළ වන්නකි. රසල්ට අනුව සංශ්ලේෂී ප්‍රාගානුභූතිකයන් මගින් සත්‍ය ප්‍රාගානුභූතික මූලධර්මයන් ලබා නොදේ, සත්‍ය යථාර්ථයක් එයින් නොලැබේ, නිශ්චිත යමක් නොකිය වේ. විජගණිතයේ තිබෙන්නා වූ වැනි සත්‍යයක් කාන්ටියානු සංකල්පයේ නැති බවත්, කාල-අවකාශයේ දෘශ්‍යමාන ස්වභාවය ද අසිමිත ප්‍රමාණයක දේවල් තිබීමේ අවශ්‍යතාවය ද අතර විසංවාදයක් ඇතැයි ද රසල් පවසයි.

අවකාශය හා කාලය පිළිබඳ සිදූවු දේ ප්‍රශ්න කරමින් ප්‍රාගානුභූතික මූලධර්ම මගින් විශ්වයේ ස්වභාවය විස්තර කිරීමේ ප්‍රයත්නය බිඳහෙලි ඇත. රසල් ඉදිරිපත් කරන්නේ මනසෙන් වෙන්වූ කාලයේ බලපෑමට හසුවෙන ප්ලේතෝනික සාර්වත්‍රිකයන් වැනි වීජගණිතමය සදාචාරමය සත්‍යයන්ය. රසල්ගේ Platonic Logical Realism සංශ්ලේෂී ප්‍රාගානුභූතිකයන්ට ප්‍රවේශ වීමෙන් රසල් අතින් කාන්ට්ව විවේචනය වේ. කෙසේ වෙතත් මෙම කරුණු වලට අනුව රසල් හා ෆ්‍රෙජ් යන දෙදෙනාම සංශ්ලේෂී භාවයක් ද ගෙන ඇත.

## කාන්ට් තුළ වූ මහාද්විපික දාර්ශනික අන්තර්ගතයන්


මහාද්වීපික හා විශ්ලේෂී සම්ප්‍රදායන්හි වෙනස මෙන්ම කාන්ට්ගේ සම්බන්ධතා තේරුම්ගත හැක්කේ යමෙක් කාන්ට් කියවන ආකාරය මතය. මහාද්වීපික දර්ශනය හා සම්බන්ධව උසස් අභිමතාර්ථයන්ගෙන් යුත් කාන්ට්ගේ තෙවන විචාරය (Cririque of Judgement) තුළ පෙරට වඩා බොහෝ ප්‍රශන කිරිම් තිබුණි. මේවා දාර්ශනිකව සාධාරණීකරණය කළ හැකිද? නොහැකිද? යන්න විවිධ මහාද්විපිකයන්ට ප්‍රශ්නයක් වි ඇතිබවත් පෙනේ. ඔවුන්ට අවශ්‍යය වූයේ **කාන්ටියානු ද්වෛතය** වෙනුවට එක්සත්බවත් ගෙන ඒමටය.

මේ අනුව කාන්ටියානු බලපෑම පශ්චාත්කාලින යුරෝපීය දර්ශනයට අයත් විවිධ අංශවල පෙනේ. එය ජර්මනිය, බ්‍රිතාන්‍ය, ප්‍රංශය යන රටවලද ප්‍රචලිත විය. එනිසා කාන්ට් වනාහි විශ්ලේෂී හා මහාද්විපික දර්ශනයන්ට පොදු අවසන් ජර්මන් චින්තකයාය. කාන්ට් ගේ **ශුද්ධ විචාරයේ පරීක්ෂාව** ඔස්සේ ප්‍රවේශ වුවහොත් අපට මුණගැසෙන්නේ ඥානවිභාගාත්මක ප්‍රශ්නයයි. **විනිශ්චයේ පරීක්ෂාව**

ඔස්සේ ගියහොත් මුණගැසෙන්නේ සෞන්දර්යයවාදී ප්‍රශ්නයන්ය. දැනුම හා ප්‍රඥාව අතර පරතරය උගන්වමින් සදාචාරය දැනුමට නොව, ප්‍රඥාවට සම්බන්ධ යැයි පෙන්වමින් වටිනා අදහස් සමූහයක් දුන් මහාද්විපික දර්ශනය වඩාත් ජිවමාන ප්‍රශ්න සමග සිටින නිසා මෙහිදි වැදගත් වන්නේ කාන්ට්ගේ **විනිශ්චයේ පරීක්ෂාව** (Cririque of Judgement) කෘතියේ අන්තර්ගතයන්ය. මෙම කෘතයේදි කාන්ට් උත්සාහ කළේ අවබොධනයේ පදාර්ථයන් හා ආචාර ධර්ම ක්ෂේත්‍රයේදී කතාකරන නිදහස පිළිබඳ අවධානය යන ක්ෂේත්‍රයන් දෙක අතර පාලමක් දැමීමටයි. මිනිසාට හිමි විනිශ්චය කිරීමේ පීඨය මගින් මෙම පාලම දමා ඇත. විනිශ්චය වනාහි ස්වභාවදහම නම් යථාර්ථය හා නිදහස නම් යථාර්ථය අතර එකගත්වයයි. වෙනත් ලෙසකට කියන්නේ නම් ශුද්ධ විචාරය හා දෙවනුව දක්වන ප්‍රයෝගික විචාරය, තෙවන විචාරය තුළ එකට ඒකාබද්ධ කරඇත.

කාන්ට්ගේ මෙම අදහස් දැක්වීමයි, ජර්මන් විඥානවාදයේ ප්‍රධානීන් වූ **ෆිෂ්ටේ, හේගල්, ෂෙලින්** සහ **ජර්මානු රොමැන්ටික් වාදයේ දාර්ශනිකයන්ට** බලපා තිබෙන්නේ.

උදාඃ-




කාන්ට්ගේ තෙවන විචාරයේ මුල් කොටසේ අවසන් භාගයේ දක්වෙන **මනෝරටාව හා සංකේතයන්** (Schema and Symbols) පිළිබඳ සාකච්ඡාව (මනස විසින් කිසියම් වස්තුවක් මනසටම නැවත ඉදිරිපත් කරන ආකාරය පිළිබඳ ප්‍රශ්න සමූහය) විසිවන ශතවර්ෂයේ සිදු වූ මහිද්විපික දර්ශනයේ වර්ධනයට මුල් වේ.

සත්‍යවශයෙන් ම ජර්මන් විඥානවාදය තේරුම් ගැනීමට සිදුවන්නේ මහාද්විපික දාර්ශනික ප්‍රවේශයක් හා කාන්ට් විසින් විවෘතකළ දාර්ශනික ප්‍රශ්නයන්ට නොයෙක් ලෙස පිළිතුරු දුන් ප්‍රවාදයක් ලෙසත්ය. කාන්ට්ගේ විප්ලවීය ව්‍යාපෘතිය සම්පූර්ණ කළේ **Fichte, Hegle, Schelling** වැනි පශ්චාත් කාන්ටියානු දාර්ශනිකයන් ය.

කාන්ට් විසින් දර්ශනය තුළ පිරිවිය නොහැකි ආකාරයේ හිඩසක් ඇති කළේ ද්වෛතය මගිනි. මෙය **විෂම ද්වෛතයකි.**

උදාඃ- 01. සංවේදනය- අවබෝධනය

02. රාජ්‍යය-අන්තර්ගතය

03. බුද්ධිය-අත්දැකීම්

04. ස්වභාවය-නිදහස

05. ශුද්ධ-ප්‍රායෝගික

06. ප්‍රපංචය-නිෂ්ප්‍රපංචය

07. දැනගත හැකි-දැනගත නොහැකි

08. ප්‍රගානුභූතික-පශ්චාත් ආනුභූතික

09. තර්ක බුද්ධිය-ආනුභූතිය

වශයෙන් මෙය සිදු වී ඇත.

මෙවන් බෙදීම් පිළිනොගන්නා පසු විඥානවාදීන් එය ඉක්මවා ගියහ. එයට හේතුව චින්තනය භාෂාව මත පදනම් නොවීමයි. **භාෂාව නොමැතිව චින්තනය ඇතිවිය හැක.(ඩොම්ස්කි)**

මෙහිදී කාන්ට්ගේ බලපෑමට ලක් වූ ප්‍රධානතම දාර්ශනිකයා වූයේ **Johan Georg Hamann (ජෝන් ජෝර්ජ් හමන්)** ය. මොහු 1784 දී **Meta Critique of the Purism of Reason** යන කෘතිය තුළින් **ප්‍රතිබුද්ධිවාදයක්** මතුකල ජර්මානු රොමැන්ටික්වාදියෙකි. මොහුගේ සංකල්පය වූයේ **අධිවිචාරය** (Meta Critique) යන්නයි. මෙහි අඩංගු වූයේ සෞන්දර්යය හා සංස්කෘතික ව්‍යාපෘතීන්ය. මොහු කාන්ට්ගේ ආකෘතිය හා අන්තර්ගතය එකිනෙක වෙන වී තිබූ දර්ශනය විවේචනය කළේය. **හමන්** පවසන්නේ අත්දැකිමෙන් බුද්ධිය වෙන්කල නොහැකි බවය. මෙය දර්ශනයේ භාෂාත්මක හැරවුමකට අදාළ විය.

මීට අමතරව කාන්ට්ගේ ද්වෛතය ඒකරාශි කිරීමේ අවශ්‍යතාව දුරතියා දුටුවේ කාන්ට්ගේ බලපෑමට ලක්වූ **ෆීෂ්ටේ** ය. මොහුගේ 1797 දී **The Doctor in Seience** නැමති කෘතියේ දි කාන්ටියානු ද්වෛතය එක්තැන් කරන්නේ **ජීවශක්තිය (force of life)** නැමති සංකල්පයෙනි. ෆීෂ්ටේගේ ප්‍රධාන මූලධර්මය වන **ස්වතන්ත්‍රතාව** (freedom) ප්‍රභවය වී ඇත්තේ කාන්ට්ගේ ආනුභූතියේ ඒකකයේ බලපෑමට අනුවය. මේ අනුව ප්‍රධාන පෙළේ ආනුභූති-උත්තරවාදියෙක් වූ මොවුට කාන්ට්ගේ සදාචාර දර්ශනය බෙහෙවින් බලපා ඇත.

මහාද්වීපික දර්ශනය සමග කාන්ට්ගේ සම්බන්ධය කතාකිරිමේදී අපට හමුවෙන තවත් වැදගත් දාර්ශනිකයෙකි **ජෝර්ජ් හේගල්**. ජර්මන් දර්ශනයේ මුදුන්මල්කඩ හේගල්ට බලපා ඇත්තේ කාන්ගේ නිෂ්ප්‍රපංචයයි. කාන්ට්ව හොඳින් අධ්‍යයනය කරමින් ඔහුගේ අඩුපාඩු දකිමින් ඔහු සමග ආදරය හා ද්වේෂය මුසු බැඳීමක් ඇති කරගෙන ඇත. කානට්ගේ ශුද්ධ විචාරය තුළ ඇති **ධාන-ප්‍රතිධාන සංකල්පය** හේගල්ට තදින්ම බලපා ඇත. නමුත් බොහෝ විට කාන්ට්ව විවේචනය ද කරයි. තවද කාන්ටියානු සදාචාර දර්ශනයෙන් ගම්‍යවන **චින්තන නියම, තදාත්මයබව, සත්තාවේ නියමද** හේගල් පිළිගනී. මොහුගේ අදහස් ගෙන ඒවා අභිබවා යන හේගල් කාන්ට්ගේ නිෂ්ප්‍රපංචයට නව පණක් ලබා දෙන්නේ ඔහුගේ **ප්‍රාණ ඉන්ද්‍රීය සංකල්පයේ සජීවිබව** හරහාය. **"කාන්ට් තමුසේ ඉතිහාසය ගත්තේ නැත්තේ ඇයි?"** යනුවෙන් හෙගල් කාන්ට්ගේ අදහස් වල දුර්වලතා ද දක්වා තිබේ.

තවද ආත්මීය නිදහස මහාද්වීපික දර්ශනය තුළ සුවශේෂී වූ අතර, කාන්ට් විසින් ඇතිකළ බෙදීම් වලට පිළිතුරු වශයෙන් හේගල් හා ෂෙලින් යන දෙදෙනාම ස්වභාවදහම වනාහි මනසේම වර්ධනයක් ලෙස පිළිගෙන ඇත. කාන්ට්ගේ බොහෝ ප්‍රශ්නයන්ට මෙසේ පිළිතුරු ලැබුණු අතර, හේගෙලියානු දර්ශනය කොජෙව් ( Kojeve ) වැන්නන් හරහා ප්‍රංශයේ දාර්ශනික ප්‍රබෝධයක් ඇති කිරීමට විශාල බලපෑමක් කර ඇත.

ජර්මානු දාර්ශනික ආතර් ෂොපර්හවර් සඳහාද කාන්ටියානු ආභාසය ලැබී ඇති අතර, ඔහුගේ ලියන කමරයේ කාන්ට්ගේ උඩුකයේ රූපයක් මෙන්ම බුදුපිළිමයක්ද විය. ඔහුට මහත් ගෞරයවයක් ද දක්වා ඇත. **පළමු විචාරයේ-ආනුභූති ලෝකය වනාහි මනුෂ්‍ය බුද්ධියෙන් සැකසුණු ප්‍රපංච ලෝකයයි** යන චින්තාව ෂොපන්හවර් ද පිළිගනී. ඒ බව ඔහුගේ මූලික ඉගැන්වීම් වන **ලෝකය වනාහි මාගේ අභිප්‍රාව හා සංකල්පය මගින් ජනිත කෙරෙන ප්‍රක්ෂේපණයකි** යන්නෙන් ගම්‍ය වේ. තවද **මිනිස් බුද්ධි ආයතන තුළ නිසගයෙන් ම පිහිටි අවිද්‍යා -මායා ස්වරූපයක් ඇත** යන අදහස ද කාන්ට්ගේ වන අතර, එයද මොහුට බලපා ඇතැයි **ක්ලෙමන්ට් වෙබ් (Klement Webb)** පවසයි.

තවද මහාද්වීපික දර්ශනය තුළ වැදගත් ස්ථානයක් ගන්නා ප්‍රපංච විද්‍යාව ආරම්භ කළ **එඩ්මන්ඩ් හුසර්ල්** කෙරෙහි ද කාන්ටියානු චින්තනය බලපා ඇති බව පෙනේ. මොහු කාන්ටියානු කෘති මහත් ඕනෑකමින් පරිශීලනය කරමින් පුද්ගල විඥානයට ගොදුරුවන දේ මැනවින් විමසා ඇත. කාන්ට්ගේ **ප්‍රකේවලත්වය** නැමැති සංකල්පය පිළිනොගත්ත ද විශ්ලේෂක දර්ශනයේ එන **ආනුභූති-උත්තර ක්‍රමය** මොහු පිළිගනී. මොහු **ස්වකීය ආනුභූති-උත්තර ක්‍රමය** දියුණු කරන්නේ මෙමගිනි. තවද හුසර්ල් විසින් **බ්‍රෙන්ටානෝ හා ෆ්‍රෙජ්** යන දෙදෙනාගේ චින්තාද කාන්ටියානු පදනමක් මත ඉදිරිපත් කරයි.

**මාර්ටින් හයිඩෙගර්** ද මෙහිදී වැදගත්ය. **දූනීම ඇතිවීමෙහිලා පරිකල්පනය වැදගත් වේ** යන කාරණය කාන්ට් ප්‍රථමයෙන් පවසා ඇත. හයිඩෙගර් ද මෙම අදහස පිළිගෙන ඇත. එසේම කාන්ට් පිළිබඳ **Kant and the problem of metaphysics** යන කෘතියක් ද ලියයි. එහිදී ශුද්ධ පරීක්ෂාව ගැනද දක්වා ඇත. මොහුගේ **විමුක්තිය සංකල්පය** ද කාන්ට්ට සමානය.

**අපගේ සදාචාර ක්‍රියා හුදෙක් අප විසින්ම තෝරා බේරා ගත යුතුය** යන්න සත්වාදයේ හි ප්‍රධාන සංකල්පයක් වන අතර මෙය මැනවින් කැපී පෙනෙන්නේ **ජෝන් පෝල් සාත්‍රේ** ගේ දර්ශනයෙහිය. මොහු විසින් සදාචාර ක්‍රියා පිළිබඳව ඉදිරිපත් කෙරෙන **සාර්වත්‍රීකරණය (universalization)** කාන්ට් විසින් පූර්වයෙන් ම ඉදිරිපත් කර ඇති **සාර්වත්‍රික නියමය** නැමති ඉගැන්වීමේ බලපෑමක් බව පෙනේ.

තවද 18 වන ශතවර්ෂයේ අගභාගය ගතහොත් ජර්මන්යේ ආගම සම්බන්ධයෙන් දාර්ශනික ප්‍රශ්න කිහිපයක් ම ගොඩනැගුණි. මෙහි ප්‍රධානියෙකි, **හෙන්රිච් ජාකෝබි.** මෙකල ඇතිවූ ආගමික ගැටුමට **කාන්ට්, හයිඩෙගර්, හමන්**, **ගතේ** යන අයද සහභාගි විය. කාන්ට්ගේ දර්ශයේ ආගමික විශ්වාසයන් තර්ක බුද්ධිය මගින් ප්‍රශ්න කරන සුලු දර්ශනයක් ඉදිරිපත් කර තිබුණි. බුද්ධිප්‍රබෝදයෙන් ඉදිරිපත් වූයේ **බුද්ධිවාදී අදේවවාදයකි.** මේවා ඔස්සේ පසුකාලීන මහාද්වීපික දර්ශනයට අවශ්‍යය පදනම් සම්පාදනය විය. **ෆිෂ්ටේගේ විඥානවාදය** නාස්තිකවාදයෙන් එකක් ලෙස මොහු සලකා ඇති අතර, මොහුගේ දර්ශනය මගින් කාන්ට් විසින් ප්‍රශ්න කළ සාම්ප්‍රදායික පාරභෞතිකයන්

සම්භන්ධයෙන් නාස්තිකවාදි අදහස් ඉදිරිපත් කර ඇත. මෙම අදහස් ද මහාද්විපීක දර්ශනය තුළ සැලකිල්ලට ගනී.

මීට අමතරව කෙටි කරුණු කිහිපයක් සදහන් කරනවානම්, මහාද්වීපික දර්ශන සම්ප්‍රදාය ගනුදෙනු කරන්නා වූ **සර්වනාම අඛණ්ඩත්වයන්** පටන්ගත්තේ ද කාන්ට්ගෙනි. කාන්ට් තුළ ඇත්තේ ප්‍රශ්න අභිමුඛ කරගත් දර්ශනයක් නොවන අතර මහාද්වීපිකයන් ද ප්‍රශ්න පසුපස නොයයි. මහාද්වීපික දාර්ශනික **ඩෙරිඩා, හබර්මාස්** එකල පවත්නා තත්වයෙන් මිදි එම තත්වය විචාරයට ලක්කිරීම හා විමුක්තිය පිළිබඳ කාරණය ගෙනහැර දැක්වූහ. මෙහදි කාන්ට්ගේ පළමු හා දෙවනි විචාරයන් අතර ඉදිවූ පාලමක් වන තෙවන විචාරය මගින් සාකාච්ඡා වූ **කලාවිචාරය** හරහා ඉදිරිපකත් කළ **නිදහස** පිළිබඳ අදසහ ද වැදගත් ය. එසේම කාන්ට්ගේ පාරභෞතික විචාරය සමග **1789-ප්‍රංශ විප්ලවයේ විමුක්තිකාමී ආත්මය එක්තැන් වී සැදූ සෞන්දර්යය ප්‍රකාශනය** මගින් කියැවුණු **සුන්දරත්වය තුළ පමණක් සත්‍යය හා සාධුත්වය සහෝදරයන් වන බව** දැක්වෙන කරුණු ද මෙහිදි වැදගත්ය.

තවද, මහාද්වීපික දර්ශනය තුළ **ෆෙඩ්රික් නීට්ෂේ** ද සංකීර්ණ, ගැටලුසහගත චරිතයකි. **පශ්චාත් කාන්ටියානු පාරභෞතිකවාදයේ සියලු ආනුභූති-උත්තර ඇගයුම් හිස්දේවල් බවට පත්ව ඇතැයි** නිට්ෂේ පවසයි. කාන්ට්ගේ ඇගයුමට ලබාදුන් නම වූයේ **Transvalnation/ Revalution** කියාය. නිට්ෂේගේ **නාස්තිකවාදය, පාරභෞතිකවාදය** සම්බන්ධයෙන් කාන්ට්ගේ විචාරය තුළ පෙර නොදුටු පාර්ශවයකි. නමුත් කාන්ට්ගේ මූලික අදහස් මේ සියල්ලට ම සම්බන්ධ වන බව පෙනේ.

සමස්ථයක් වශයෙන් කාන්ට් පවසන, **අපගේ මනස මැදිහත්ව සංශ්ලේෂී කටයුත්තක නිරතවන බව** මහාද්විපික දර්ශනය තුළ ද අඩංගු වන සංශ්ලේෂී ක්‍රමය සමඟ සම්බන්ධය. කාන්ට් ඥානයේ පදනම ලෙස ගන්නා ප්‍රාග්-ආනුභූතික සංකල්ප මහද්වීපික දර්ශනයද අනුගමනය කර ඇත. මහාද්වීපික දාර්ශනියක් හට නැවත ඒකත්වයට ගැනීමට ඉඩක් සැලසූ දර්ශනයක් ඉදිරිපත් කළේ අන්කවරෙකුවත් නොව, එම්මානුවෙල් කාන්ට්ය. මෙය සරලව දැක්වුවහොත් **හේගල්ගේ - පරමාත්මය තුළත්, ෂොපන්හවර්ගේ - අධිෂ්ඨානය තුළත්, නිට්ෂේගේ - බලය තුලත්, සිග්මන් ෆ්‍රෝයිඩ්ගේ - අවිඥානය තුළත්, ෆිෂ්ට්ගේ - ජීව ශකිතිය තුළත් කාන්ට් ඉදිරිපත් කළ ද්වෛතය ඒකාබද්ධ කිරීමේ උත්සහයක් තිබී ඇත.** මේ නිසා මහාදිවීපික දර්ශනය හැදෑරීමෙදී ඉතාම වැදගත් දාර්ශනිකයෙක් ලෙස එම්මාන්වෙල් කාන්ට් ව හදුනාගත හැකිය. එම නිසා කාන්ට් වනාහි විශ්ලේෂී මෙන්ම මහාද්වීපික දර්ශන සම්ප්‍රදායන් දෙකටම පොදු අවසාන දාර්ශනිකයා යැයි පැවසීම සාදාරණය.

**මේ යුගය වනාහි විචාරයේ යුගයයි**, ලෙස පවසන කාන්ට්ගේ **ඥානවිභාත්මක, සදාචාරාත්මක, විචාරාත්මක** බොහෝ අදහස් ගෙන තම දර්ශනයන් දියත් කරන්නටත්, වැඩිදියුණු කරමින් ඒවා විවේචනාත්මකව ඉදිරිපත් කරන්නටත්, එමගින් තම සම්ප්‍රදායන් පෝෂණය කර ගන්නටත් විශ්ලේෂී හා මහාද්වීපික දෙපාර්ශවයටම හේතු වුයේ එම්මානුවෙල් කාන්ට් බව නිසැකයෙන්ම කිව හැකිය. ඒ අනුව කාන්ට් නැමැති ශ්‍රේෂ්ඨ දාර්ශනිකයා බටහිර දර්ශනය තුළ ස්ථාපිත කර, මහාද්විපික හා විශ්ලේෂී සම්ප්‍රදායන්ට ඔහුගෙන් ලද දායකත්වය පැහැදිලි කරගත හැක. ඒ ඔස්සේ මෙම සම්ප්‍රදායන්ගේ පිබිදීම සිදු වූ අතර, **කාන්ට් වනාහි මෙම සම්ප්‍රදායන් දෙකෙහිම රැව්දෙන පොදු, අවසන් ජර්මන් චින්තකයයි.**

## ආශ්‍රිත ග්‍රන්ථ

සිංහල


1* අභයවංශ,කපිල:*ඉම්මැනුවේල් කාන්ට්ගේ ඥානවිභාගය.* 1997,පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය,කැළණිය විශ්වවිද්‍යාලය.

2* කලන්සූරිය,ඒ.ඩී.පී: *බර්ට්‍රන්ඩ් රසල් හා සමකාලීන දර්ශනය.* 1975, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

3* ජයතිලක,කේ:*දර්ශනවාද අසබඩින්.* 2005,ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ 12.

4* රාජපක්ෂ සෙනරත්න, රානි:*දර්ශනවාදයේ ගැටලු-බර්ට්‍රන්ඩ් රසල්.* 1993,කර්තෘ ප්‍රකාශනයකි.

5* විදානගමගේ,කුලසේන:*සමකාලීන භාෂාමය දර්ශනය-ලුඩ්විග් විට්ගන්ස්ටෛන්.* 1993,කර්තෘ ප්‍රකාශනයකි,විහාරගම,නාරම්මල.

6* වීරසිංහ,එස්.ජී.එම්: *කාන්ටියානු දර්ශනය පිළිබඳව විචාර පූර්වක අධ්‍යයනයක්.* 1988, විද්‍යාලංකාර ප්‍රකාශන, කැළණිය.


English


1) Critchley Simon;*Continental philosophy-A very short Introduction.*2001,Published in the United States,by Oxford University press Inc,New York.


Internet


1) http//: www.wikipedia.org/Critique of Judgement.